# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authorty

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PR/37/2022

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.

දිනය / திகதி / Date 2022.02.10

## මාධ්‍ය නිවේදනය

**ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණයට ඊපීආර් (EPR) සංකල්පය හඳුන්වාදීමට**

**මධ්‍යම පරිසර අධිකාරියෙන් වැඩපිළිවෙළක්....**

ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණයට ඊපීආර් (EPR - Extended Producer Responsibility) සංකල්පය හෙවත් "නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම" යන සංකල්පය හඳුන්වාදීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරමින් සිටී. ඒ පිළිබඳ සාකච්ඡාවක් ඊයේ (09) මධ්‍යම පරසර අධිකාරියේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විය. ප්ලාස්ටික් ඇසුරුම් භාවිත කරන හෝ නිෂ්පාදනය කරන පාර්ශවකාර නිෂ්පාදන ආයතනවල නිලධාරීන් නව වැඩපිළිවෙළ පිළිබඳ දැනුම්වත් කිරීම සහ ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සාකච්ඡාවේ අරමුණයි.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. අමරසිංහ මහතාගේ මූලිකත්වයෙන් පැවති එම සාකච්ඡාව සඳහා අමාත්‍යාංශ, ලංකා වාණිජ මණ්ඩලය, ව්‍යාපාරික ආයතන සහ ව්‍යාපාරික සංගම් නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් ද මධ්‍යම පරිසර අධිකාරියේ කසළ කළමනාකරණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජේ. එම්. යූ ඉන්ද්‍රරත්න මහතා ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් ද නිලධාරීන් ද සහභාගීවිය.

ලෝකයේ බොහෝ රටවල් ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ඊපීආර් (EPR) සංකල්පය හෙවත් "නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම" යන සංකල්පය යොදා ගනී. එමගින් යම් ප්ලාස්ටික් ඇසුරුමක් සහිත නිෂ්පාදනයක් නිපදවනු ලබන නිෂ්පාදකයා අදාළ ඇසුරුම ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමුකිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු අතර එම ක්‍රමවේදයට අනුගත වීම පාරිභෝගිකයා සතු යුතුකමක් ලෙස දැක්වේ. මෙම ක්‍රමවේදයට අනුව, ප්ලාස්ටික් ඇසුරුමක් සහිත නිෂ්පාදනයක් පාරිභෝගිකයා විසින් මිලදී ගනු ලබනවිට ඇසුරුම සඳහා මුදලක් රඳවාගනු ලබන අතර අදාළ ඇසුරුම ඇසුරුම් එකතුකරනු ලබන ස්ථානයකට භාරදී පාරිභෝගිකයාට එම රඳවාගත් මුදල ලබාගත හැකිය.

මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික සාකච්ඡා 2017 වර්ෂයේ ඇරඹුණු අතර මේ වනවිට එම වැඩපිළිවෙළ අවසන් අදියරේ පවතී. මෙම ක්‍රමවේදය නීතිගත කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතේ නව සංශෝධනය සඳහා ඇතුළත් කිරීම ද සිදුකර ඇත.

ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන පරිසරයට අහිතකර බලපෑම් එල්ල නොවන අයුරින් භාවිතයට ගැනීම සහ පරිසරයට මුදාහැරීම නවතාලීමටත් මෙම ඇසුරුම් විධිමත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියකට යොමුකිරීමටත් අවශ්‍ය නියාමන කාර්යයක් සඳහා යොමුවීම නව වැඩපිළිවෙළේ අරමුණයි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය